Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved]

01 S

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව /இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2570 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026

(01) බුද්ධ චරිතය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. (i) බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළ මහාබ්‍රහ්මගේ බලය ප්‍රකාශ කෙරෙන යෙදුම් හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) බ්‍රාහ්මණ පූජකයන්ගේ අනුශාසකත්වය, සංවිධානය හා මෙහෙයවීම ද ඇතිව පැවැත්වූ යාගහෝම හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

   (iii) බ්‍රාහ්මණ සමාජ සංවිධානය තුළ තුන්වැනි ස්ථානය හිමි වූ වෛශ්‍යයන්ට අයත් ස්වධර්ම ලියා දක්වන්න. (ලකුණු 06 යි)

   (iv) බුද්ධකාලීන භාරත සමාජය විවිධාකාර විෂමතාවන්ට ගොදුරුවීමෙහිලා වර්ණධර්ම හේතු වූ අයුරු සඳහන් කර කුල ක්‍රමය පිළිබඳ බුදුසමයේ විචාරය ගෙනහැර දක්වන්න. (ලකුණු 06 යි)

2. (i) ශ්‍රමණ සම්ප්‍රදාය නියෝජනය කළ පරිබ්‍රාජකයන් හතරදෙනකු නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) පරිබ්‍රාජක තවුසන් වාද-විවාද කළ දාර්ශනික ප්‍රශ්න හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

   (iii) පරිබ්‍රාජක තාපස චර්යා හඳුන්වා, ඔවුන් බුදුරදුන් සමග පැවැත්වූ සබඳතා විස්තර කරන්න. (ලකුණු 06 යි)

   (iv) භාරතීය ආගමික හා දාර්ශනික පරිසරයෙහි මුල්තැනක් ගෙන තිබූ ආත්මවාදය හටගත් අයුරු විමසීමට ලක්කරන්න. (ලකුණු 06 යි)

3. (i) රාජාණ්ඩු, සමූහාණ්ඩු හා අවන්ති ජනපදය හැරුණු විට බුද්ධකාලීන භාරතයේ පැවති සොළොස් මහාජනපද අතුරින් හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) අවන්ති මහාජනපදයේ අගනුවර, බුද්ධකාලීන පාලක රජු, එහි සතර දේශසීමා සඳහන් කර, එම ජනපදය බුදුසසුනට තිබූ සබඳතාව දක්වන්න. (ලකුණු 04 යි)

   (iii) බුදුරදුන් විසින් අගය කරනු ලැබූ සමූහාණ්ඩු පාලක ප්‍රතිපත්තියක් ලෙස සප්ත අපරිහානීය ධර්ම අතුරින් හයක් ලියා දක්වන්න. (ලකුණු 06 යි)

   (iv) බුද්ධකාලීන භාරතයේ පැවති රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ගෙනහැර දක්වා, රාජ්‍ය පාලනය විෂයයෙහි බුදු සමයේ ආකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

II කොටස

4. (i) දෙව්දහ නුවර කෝළිය පරපුරේ අංජන රජුගේ පුත්‍රයන් දෙදෙනා හා දියණියන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) කපිලවත්ථු නුවර ශාක්‍ය පරපුරේ සිංහහනු රජුගේ හා කාංචනා බිසවගේ පුත්‍රයන් දෙදෙනකු හා දියණියන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 04 යි)

   (iii) ශාක්‍ය රාජ පරපුරේ ආදිපුරුෂයා, කපිලවත්ථු නගරය බිහිවීම හා එහි කුමාරවරුන්ගේ විවාහයන් යන කරුණු අන්තර්ගත වන පරිදි එම පරපුරේ ඓතිහාසික පසුබිම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

   (iv) ශාක්‍ය-කෝළිය රාජ පරම්පරා දෙක බෝසත් හා බුදුසිරිත සමඟ සම්බන්ධ වන අවස්ථා තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

[2 වැනි පිටුව බලන්න.

Scanned with CamScanner

Past Papers Wiki

5. (i) සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ කිං කුසලගවේසීව හැසිරීමේදී හමුවූ ආචාර්යවරුන් දෙදෙනකු හා ඔවුන් විසූ ස්ථාන දෙක නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) එම තාපසවරුන් ලබා තිබූ අරූපාවචර ධ්‍යාන සමාපත්ති හතර ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බුදුරදුන් බෝසත් අවධියේ සිදුකළ දුෂ්කර ක්‍රියාව ජානුස්සෝනි බ්‍රාහ්මණයාට හා සව්වකට විස්තර කළ කරුණු ඇසුරින් කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි)

(iv) සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ බුද්ධත්වය සඳහා අනුගමනය කළ ධර්ම මාර්ගය ගෙනහැර දක්වා, ඒ සඳහා සිත වැඩූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

6. (i) බුදුසසුනෙහි ප්‍රථම රහත් සැට නම අතුරින් යස කුලපුත්‍රයාගේ සමීපතම මිත්‍රයන් සතරදෙනා නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුදුසසුනෙහි තෙරුවන් සරණ ගිය පළමු උපාසක හා උපාසිකාවන් දෙපල නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) පස්වග භික්ෂූන් වහන්සේ බුදුසසුනෙහි මුල්ම රහතන් වහන්සේලා වීමේ භාග්‍යය හිමිකරගත් ආකාරය, ශ්‍රවණය කළ සූත්‍ර දේශනා ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) බුදුරජාණන් වහන්සේ දෙව්-මිනිසුන් උදෙසා දේශනා කළ ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි ඇතුළත් ශ්‍රේෂ්ඨ දර්ශනයක මූලික ලක්ෂණ විමසීමට ලක්කරන්න. (ලකුණු 06 යි)

III කොටස

7. (i) බුදුරදුන්ගෙන් පිහිට ලද විවිධ පුද්ගලයන් අතුරින් හතරදෙනකු නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුද්ධ චරිතය තුළ විද්‍යමාන වූ විශිෂ්ට මානව ගුණාංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) බුදුරදුන්ගේ ඉවසීමේ ගුණය ප්‍රකට කළ අවස්ථා දෙකක් උදාහරණ ඇසුරෙන් කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි)

(iv) බුද්ධ චරිතයෙන් ප්‍රකට වන ගිලනුන්ට උපස්ථාන කිරීමේ අවස්ථා දෙකක් උදාහරණ ලෙස දක්වා, නූතන සමාජයට ඉන් ලබාදෙන ආදර්ශ පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

8. (i) බුදුරජාණන් වහන්සේගේ දිනචර්යාවට අයත් දවසේ ප්‍රධාන කොටස් අතුරින් හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) බුදුරජාණන් වහන්සේ වස්වසා වැඩ සිටි ස්ථාන හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත 8 (i)හි ඔබ සඳහන් කළ දවසේ ප්‍රධාන කොටස් අතුරින් දෙකකට අදාළව බුදුරදුන් කාලය ගත කළ ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 06 යි)

(iv) බුදුරජාණන් වහන්සේ කාලයෙන් උපරිම ප්‍රයෝජන ගත් අයුරු පෙන්වා දී, උන්වහන්සේගේ දිනචර්යාවෙන් ගතහැකි ආදර්ශ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) සීවලී මහරහතන් වහන්සේ හා රාහුල තෙරුන් වහන්සේ ද මහාප්‍රජාපතිගෝතමී තෙරණිය හා භද්දකච්චායනා තෙරණිය ද බුදුසසුනෙහි ලද අග්‍රස්ථාන නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) රාහුල තෙරුන් හා භද්දකච්චායනා තෙරණිය අරමුණු කොට දේශිත සූත්‍ර හා ජාතක දේශනා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) මහාප්‍රජාපතිගෝතමී තෙරණිය පිළිගත් අෂ්ට ගරු ධර්ම අතුරින් භයක් ලියා දක්වන්න. (ලකුණු 06 යි)

(iv) භික්ෂුණී ශාසනය තුළ භාරතීය කාන්තාව ලද විමුක්තිය විමසීමට ලක්කරන්න. (ලකුණු 06 යි)

10. (i) බුදුසසුනෙහි ප්‍රථම ද්වේවාචික උපාසකවරුන් දෙපල, බුදුසරණ ගිය ප්‍රථම උපාසිකාව හා විශ්වාස කථා ඇතියන් අතර අගතනතුර ලත් උපාසිකාව වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) මගධාධිපති බිම්බිසාර රජතුමා සිය ජීවිතයේ සමෘද්ධ කරගත් ප්‍රාර්ථනා අතුරින් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) මෛත්‍රී විහාර ඇති උපාසිකාවන් අතුරින් අගතනතුරු ලැබූ සාමාවතී බිසවගේ චරිතය කෙටියෙන් දක්වා, ඉන් අපට ගත හැකි ආදර්ශ පෙළගස්වන්න. (ලකුණු 06 යි)

(iv) බුදුසසුනෙහි උන්නතිය උදෙසා වර්තමාන උපාසක-උපාසිකාවන් විසින් පිළිපැදිය යුතු ඔබගේ යෝජනා කෙටියෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 06 යි)

***

Scanned with CamScanner
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library